මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගමේ (“සමාගම”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින්වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක්වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක්වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවටවන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහිවන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලනකල සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 වැනි ඡේදය ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද පිරිවැය රු. මිලියන 883.88ක් වූ දේපල පිරියත හා උපකරණවල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කිරීමකින් තොරව සමාගම විසින් එම වත්කම් අඛණ්ඩව භාවිතා කරමින් පැවතුණි.	ඇස්තමේන්තු ජීව කාලය වෙනස් වීම මත වත්කම් නැවත අගය කිරීම සිදු කිරීමට සැලසුම් කර ඇති අතර සුදුසු පරිදි වත්කම් ඛාණ්ඩ වශයෙන් තක්සේරු කිරීමට සැලසුම් කර ඇති බව.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ)	සමාගමේ අභ්‍යන්තර ඒකක අතර සිදුවන ගනුදෙනු අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සැසඳීම්කර හා නිවැරදිකර මූල්‍ය ප්‍රකාශන සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සිදු කළ යුතු වුවත් වෙළඳ ගෙවිය යුතු දෑ, ගෙවිය යුතු රඳවාගැනීම් සහ වෙළඳ ලැබිය යුතු දෑ පිළිවෙලින් රු.මිලියන 64.85ක්, රු.මිලියන 28.42ක් සහ රු.මිලියන 26.54ක් සමාගම නමින්ම ඇතුළත් කර තිබුණි.	එම අයිතම පිළිබඳව වැඩිදුර සොයා බලා ලබන වසරේ දී නිසි පරිදි ගිණුම්ගත කරනු ඇත.	සමාගමේ මූලික කාර්යාල හා අංශ අතර සිදුවන ගණුදෙනු සහ ශේෂයන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගැලපුම් කිරීමට කටයුතු කළ යුතුය.

ආ)	සමාගමේ මූලික කාර්යාල අතර සිදුවූ රු.මිලියන 27.71ක අභ්‍යන්තර ගණුදෙනු වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කිරීමෙන් ආදායම එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.	ලබන වසරේ දී නිසි පරිදි ගිණුම්ගත කරනු ඇත.	සමාගමේ මූලික කාර්යාල හා අංශ අතර සිදුවන ගණුදෙනු සහ ශේෂයන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගැලපුම් කිරීමට කටයුතු කළ යුතුය.
ඇ)	2024 ජනවාරි මස සිදු කළ වාර්ෂික තොග සහ වත්කම් සත්‍යාපනය අනුව දකුණු පළාතේ ගාල්ල හා මාතර යන ව්‍යාපෘති ඒකකවලට අයත් තොග සහ වත්කම් අයිතම රාශියක අතිරික්තයක් ඇති බවත්, ඉවත් කළ ස්ථාවර වත්කම් ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධතිය තුළ තවදුරටත් පවතින බවත්, සහ වත්කම් අයිතම කිහිපයක ඌණතා පවතින බවත් අනාවරණය වී තිබුණි. කෙසේ වෙතත් එම අතිරික්තතා හා ඌණතාවල මූල්‍යමය වටිනාකම එම පද්ධතිය තුළ ගැලපුම් කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව අදාළ අයිතම ගිණුම්ගත කිරීම ඉදිරියේදී සිදුකරනු ඇත.	අතිරික්තතා සහ ඌණතාවල මූල්‍ය වටිනාකම හඳුනාගෙන ERP පද්ධතිය තුළ ගැලපුම් කිරීමට කටයුතු කළ යුතුය.
ඇ)	සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් යටතේ දක්වා තිබුණු රු.මිලියන 2.74ක වත්කම් අපහරණ ලාභය තුළ පෙර වර්ෂවල අපහරණයන්ට අදාළ අධි ක්ෂය ගැලපුම් රු. මිලියන 1.69ක් ඇතුළත් කර තිබීමෙන් වර්ෂයේ වෙනත් ආදායම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.	මෙම ගැලපීම මුළු ක්ෂය වියදමට සාපේක්ෂව ඉතා කුඩා මුදලක්වන බැවින් අදාළ වර්ෂයට ගැලපුම් කර ඇත.	සමාලෝචිත වර්ෂයට අදාළ නොවන වත්කම් අපහරණ ලාභය පෙර වර්ෂයට අදාළ ගැලපුම් යටතේ ගිණුම්ගත කළ යුතුය.

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම	අනුරූපී වාර්තා අනුව වටිනාකම	වෙනස	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන		
වෙළඳ ණයහිමි	62.16	53.20	8.96	මව් ආයතනයට අදාළව ගිණුම්ගත කිරීමේදී ඇතිවූ මෙම වෙනස ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.	සම්බන්ධිත පාර්ශව වෙත ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ සංසන්දනය කර නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

ගෙවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්	2,242.95	2,239.57	3.37	මව් ආයතනයට අදාළව ගිණුම්ගත කිරීමේදී ඇතිවූ මෙම වෙනස ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.	සම්බන්ධිත පාර්ශව වෙත ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ සංසන්දනය කර නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට මුළු ණයගැති ශේෂය රු. මිලියන 3,049.96ක් වූ අතර එයින් රු. මිලියන 313.43ක් සහ රු. මිලියන 152.85ක් පිළිවෙළින් වසර 03-05 අතර කාලයක් සහ වසර 05කට වැඩි කාලයක් හිඟව පවතින නමුත් එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ණයගැතියන්ගෙන් මුදල් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.	ණයගැති ශේෂයන් කඩිනමින් අය කර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 3,051.27ක ලැබිය යුතු රඳවා ගැනීම් ශේෂය තුළ වසර 3 සිට 5 දක්වා වූ රු. මිලියන 514.87ක්ද, වසර 05ට වැඩි රු. මිලියන 490.75ක්ද අයකර ගැනීමට කටයුතු කරගෙන නොතිබුණි	රඳවාගත් මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.	ලැබිය යුතු රඳවා ගැනීමේ ශේෂයන් අය කර ගැනීමට කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව අප්‍රමාදව කටයුතු කළ යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 1,671.90ක ණයහිමි ශේෂය තුළ රු.මිලියන 400ක් වසර 2 සිට 5 දක්වා කාලයක් තුළ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන අතර මුදල් ලැබෙන පරිදි ණයහිමියන් වෙත ගෙවීම් කිරීමට බලාපොරොත්තු වනු ඇත.	මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ගෙවිය යුතු ශේෂයන් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 875.45ක ගෙවිය යුතු රඳවා ගැනීම් ශේෂය තුළ ඇතුළත් රු. මිලියන 434.44ක් වසර 2 සිට 5 දක්වා ද, රු. මිලියන 189.67ක් වසර 05ට වැඩි කාලයක සිට ද නිරවුල් කර නොතිබුණි.	ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන අතර මුදල් ලැබෙන පරිදි ගෙවීම් කිරීමට බලාපොරොත්තු වනු ඇත.	ගෙවිය යුතු රඳවා ගැනීම් ශේෂයන් කඩිනමින් නිරවුල් කිරීමට හැකිවන අයුරින් සුදුසු ක්‍රියාමාර්ග හඳුන්වා දිය යුතුය.

1.7 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් මව් ආයතනයට එනම් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට රු. මිලියන 1,569.40ක් ගෙවිය යුතුව තිබුණ ද මේ සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර නිසි සහ යාවත්කාලීන ගිවිසුම් පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර මෙම ශේෂය නිරවුල් කිරීමට ආයතන දෙකෙහි කළමණාකාරීත්වය විසින් කිසිදු ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	රට තුළ පැවති අයහපත් ආර්ථික තත්ත්වය ව්‍යාපෘතිවල මුදල් ප්‍රවාහයට දැඩි ලෙස බලපා ඇති හෙයින් අන්තර් සමාගම් ජංගම ගිණුම් ශේෂය ඉහළ ගොස් ඇත. මව් සමාගමට ගෙවිය යුතු දිගුකාලීන ශේෂ ප්‍රාග්ධනීකරණය කිරීමේ ක්‍රමයක් හඳුනාගැනීම සඳහා එම ශේෂ සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියක යෙදෙනු ඇත.	සමාගම හා කාර්යාංශය අතර සිදුවන ගණුදෙනු සඳහා පැහැදිලි ගිවිසුම් ඇතිකර ගත යුතු අතර අදාළ ගෙවිය යුතු ශේෂ හෙළිදරව් කිරීමට හා නිරවුල් කිරීමට නොපමාව පියවරගත යුතුය.

1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත 38 (1) ඇ සහ 38 (2) වගන්ති	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් එක් එක් අස්ථිත්‍යයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යන බවට සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය. තවද මෙම සමාලෝචනය ලිඛිතව සිදුකළ යුතු අතර එහි පිටපතක් විගණකාධිපතිවරයාටද ලබාදිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ආයතනයේ මූල්‍ය පාලනය සඳහා ERP පාලන පද්ධතියක් 2018 ජනවාරි 01 දින සිට පවත්වාගෙන යන අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව සමාලෝචනය කිරීම සිදු කරනු ඇත.	විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර පාලනයන් පිළිබඳව ලිඛිතව සමාලෝචනයන් කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

(ආ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදුන් මෙහෙයුම් අත්පොත			
(i) 4.3 (iii) ඡේදය	සමාගම විසින් සියලුම තොග ලැබීම් සහ නිකුත් කිරීම් කළමනාකරණය කිරීම සඳහා විධිමත් තොග කළමනාකරණ පද්ධතියක් පවත්වා ගත යුතු වුවද සමාගම විසින් භාවිතා කරන ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP) අනුව විධිමත් කාල විශ්ලේෂණ වාර්තා උත්පාදනය කිරීමට හැකියාවක් නොමැති බැවින්, යල් පැනගිය, සෙමින් චලනය වන සහ චලනය නොවන අයිතම හඳුනා ගැනීමට නොහැකිවී තිබුණි.	ERP පද්ධතිය මඟින් තොග කාල විශ්ලේෂණයක් ලබා ගත නොහැකි නමුත් වාර්ෂිකව සිදු කරන ගබඩා තොග සමීක්ෂණයේදී සියලු යල් පැන ගිය තොග ස්වාධීන පාර්ශවයක් විසින් නිරීක්ෂණය කර අවශ්‍ය පියවර ගනු ඇත.	සමාගම විසින් තොග කළමනාකරණය සඳහා විධිමත් තොග කළමනාකරණ පද්ධතියක් (ERP) හඳුන්වාදීමට නොපමාව පියවර ගත යුතුය.
(ii) 3.2 හා 3.4 ඡේද	විවිධ තනතුරු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට පෙර සමාගම තුළ අනුමත බඳවා ගැනීම් පරිපාටියක් සහ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ සැලැස්මක් තිබිය යුතු වුවද, එවැනි පටිපාටියක් හා සැලැස්මක් 2025 මාර්තු 31 දිනවන විටත් සමාගම විසින් සකස් කර අනුමත කරවා ගෙන නොතිබුණි.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කර ඇත.	බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටිය සකස්කර ඒ සඳහා කඩිනමින් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(iii) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (iii) ඡේදය	කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීම් කිරීමේදී නියමිත ගෙවීම්වලින් සියයට 90ක් ගෙවීමට ප්‍රථමයෙන් ඔවුන් වෙත ගෙවූ අත්තිකාරම් මුදල් සම්පූර්ණයෙන් අයකරගත යුතු වුවත්, 2024 දෙසැම්බර් 31 දින වන විට මූලික කාර්යාල 06ක ව්‍යාපෘති වැඩකටයුතු සියයට 90 ත් 100ත් අතර නිමවූ ව්‍යාපෘති 16කට අදාළ එකතුව රු. මිලියන 376.67ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂයන් නිරවුල්කර නොතිබුණි.	අවසන් බිල්පත් සහතික නොවීම, අනෝන්‍ය ව්‍යාපෘති අවසන් කිරීම්වලට එළඹී තිබීම, ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවා තිබීම ආදී හේතූන් නිසා මෙම ශේෂ පවතින අතර අනාගතයේදී සේවාදායකයා වෙත පියවීමට කටයුතු කරනු ඇත.	යොමුගත මාර්ගෝපදේශය ප්‍රකාරව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතු අතර අප්‍රමාදව අදාළ බිල්පත් සහතික කිරීමේ කටයුතු ද නිමකරවා ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 664.09 ක බදු පෙර ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පෙර ලාභය රු. මිලියන 302.70 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 361.39 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පසුගිය වර්ෂයට සාපේක්ෂව කොන්ත්‍රාත් ආදායම රු. මිලියන 1,869.22 ක්, කුලී ආදායම් හා භූමි අලංකරණ වැඩ ආදායම් පිළිවෙලින් රු. මිලියන 2.30 කින් හා රු.මිලියන 26.92 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

විස්තරය	ප්‍රවර්තන වර්ෂයේ වටිනාකම	ඉකුත් වර්ෂයේ වටිනාකම	වෙනස වැඩිවීම / (අඩුවීම)	වෙනසේ ප්‍රතිශතය සියයට
	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	
<u>ආදායම්</u>				
ඉදිකිරීම් හා උපදේශණ ආදායම්	8,724.15	6,854.08	1,870.07	27
මූල්‍ය ආදායම	481.29	701.36	(220.07)	31
<u>වියදම්</u>				
විකුණුම් පිරිවැය	7,666.06	6,383.50	1,282.56	20
විකිණීමේ සහ බෙදාහැරීමේ වියදම්	1.99	14.96	(12.97)	87
මූල්‍ය වියදම	7.76	15.36	7.60	49

2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ දී දළ ලාභ ප්‍රතිශතය සියයට 12.13ක් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 77 කින් වැඩි වී තිබුණි. තවද සමාගම රු.මිලියන 15,081 ක් වූ සිය මුළු වත්කම් භාවිතා කරමින් සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 664 ක බදු පෙර ලාභයක් උපයාගෙන තිබුණි. එබැවින්, සමස්ත වත්කම්වල සාමාන්‍ය ප්‍රතිලාභ අනුපාතය සියයට 4.4 ක් විය. ඉදිරි කාල සීමාවේ දී තවදුරටත් මෙහෙයුම් ලාභය උපරිම කර ගැනීම සඳහා සම්පත් උපරිම වශයෙන් උපයෝගී කර ගත හැකි ආකාරය පිළිබඳ උපායමාර්ගික සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ)	සමාගම සහ ශ්‍රී ලංකා හදබිම අධිකාරිය ඒකාබද්ධව සිදුකළ පල්ලෙකැලේ සහ කොත්මලේ ගොවිපලවල් සඳහා පොලිටනල් ගෘහ හඳුන්වාදීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානවන විටත් දෙපාර්ශවය අතර විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. කෙසේවෙතත් කුකුල් අභිජනන ව්‍යාපෘතිය සඳහා පමණක් 2025 අප්‍රේල් මස 09 දින ඒකාබද්ධ ව්‍යාපාර ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම අනුව පළමු වසර 06 තුළ අදාළ කොන්දේසි යටතේ ශුද්ධ ලාභයෙන් සියයට 70ක් සමාගමට හා සියයට 30ක් අධිකාරියට ලෙස ලාභ බෙදාගැනීමට එකඟ වී තිබුණි. හදබිම අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු. මිලියන 3.56ක ශුද්ධ ලාභයක් උපයා තිබුණද ගිවිසුම් ප්‍රකාරව සමාගම වෙත ලාභ බෙදීමක් සිදුව නොතිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි.	සමාගම සහ හදබිම අධිකාරිය අතර ඇතිකරගනු ලැබූ අවබෝධතා ගිවිසුම පරිදි ගිණුම් ගත කිරීමේදී එය SLFRS 11 ගිණුම් ප්‍රමිතිය යටතේ ගිණුම්ගත කිරීම සිදු කළ යුතු වේ. එකී ප්‍රමිතිය පරිදි ගිණුම් ගත කිරීමේදී දෙපාර්ශවය අතර වලංගු ගිවිසුමක් පැවතීම අත්‍යාවශ්‍යවන අතර 2025 අප්‍රේල් 09 දින තෙක් දෙපාර්ශවයටම ගිවිසුමකට එළඹීමට නොහැකි වූ බැවින් හා ප්‍රමිතියේ සඳහන් පරිදි වලංගු ඒකාබද්ධ පාලනයක් පැවතීම හඳුනාගත නොහැකි බැවින් එම ව්‍යාපෘතිය සඳහා සමාගම විසින් වියදම් කළ රු.මිලියන 87.39 ක මුදල කෙරීගෙන යන වැඩ යටතේ වාර්තා කර ඇත.	ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර විධිමත් ගිවිසුමකට එළඹීමට හා ඒ අනුව ලාභ බෙදා ගැනීමටත් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමටත් පියවර ගත යුතුය.
(ආ)	නාගරික සංවර්ධන අධිකාරියට අයත් රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි පර්චස් 60 ක ඉඩමක් වසර 30 ක බදු පදනම මත ලබා ගැනීම සඳහා විධිමත් ගිවිසුමකට එළඹීමෙන් තොරව 2019 වර්ෂයේ දී රු.මිලියන 15.43 ක් බදු කුලී ලෙස සමාගම විසින් අධිකාරියට එකවර ගෙවා තිබුණු අතර මෙම ඉඩමේ සබරගමුව මූලික කාර්යාලය පිහිටුවීම සඳහා වූ ගොඩනැගිල්ල ඉදිකර තිබුණි. නීතිමය තත්ත්වයන් නොසලකා විධිමත් ගිවිසුමකට එළඹීමෙන් තොරව බදු මුදල් ගෙවීම හා ඉදිකිරීම් සිදුකිරීම අවදානම් සහගත සහ මතභේදාත්මක තත්ත්වයන් ඇති වීමට තුඩු දිය හැකි බව නිරීක්ෂණය විය.	නාගරික සංවර්ධන අධිකාරියට මෙම බදු ඔප්පුව සම්පූර්ණ කිරීම සඳහා, මෙම ඉඩමද ඇතුළත්ව අක්කර 348 කින් සමන්විත ඉඩම් කොටස් සඳහා රජයේ ඉඩම් ආඥා පනතේ 6 (1) වගන්තිය යටතේ නිදහස් දීමනා පත්‍ර නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබා ගත යුතුව ඇත. ඉහත කටයුතු අවසන් වූ පසු මෙම බදු ඔප්පුව සම්පූර්ණ කිරීමට හැකියාව පවතින බව දන්වා ඇත.	සමාගම විසින් සම්පූර්ණ බදු කුලිය ගෙවා ඇති බැවින් නාගරික සංවර්ධන අධිකාරිය සමග අදාළ ගිවිසුම අත්සන් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

(ඇ)	රඹකැන්ඔය ව්‍යාපෘතිය ප්‍රථමයෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් සිදු කරන ලද අතර සමාලෝචිත වර්ෂයේදී සමාගම වෙත භාර දී තිබුණ ද සමාලෝචිත වසර අවසානයවන විටත් මෙම භාරදීමේ ක්‍රියාවලිය නිසි ලෙස නිම කර නොතිබුණු බැවින් එම ඉඩමෙහි සිදු කරන ලද ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු ඇතුළු වත්කම්වල වටිනාකම කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණි.	මෙම කෘෂිකාර්මික ව්‍යාපෘතිය ප්‍රථමයෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය මඟින් සිදු කරන ලද අතර මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 17.28 ක පිරිවැයක් දරා ඇත. ඒ අනුව 2025 වර්ෂයේ දී මෙම මුදල සමාගමේ වාර්තාගත කිරීමට කටයුතු යොදනු ඇත.	ව්‍යාපෘතිය භාරගැනීමේ ක්‍රියාවලිය නිසි ලෙස සම්පූර්ණ කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විගණනය සඳහා සපයා ඇති තොරතුරු අනුව, සමාගම එහි සම්පූර්ණයෙන් නිමකරන ලද ඉදිකිරීම් ව්‍යාපෘතිවලින් රු.මිලියන 745.47ක්,රු.මිලියන 942.90 ක් සහ රු. මිලියන 667.42 ක මෙහෙයුම් අලාභයන් පිළිවෙළින් 2024, 2023 සහ 2022 වර්ෂයන් හි දී ලබා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක වෙමින් පවතින ඉදිකිරීම් ව්‍යාපෘති 203න් 35ක එකතුව රු.මිලියන 444.49 ක අලාභයක් සිදුව තිබුණි. එම අලාභදායී තත්වයට හේතු වූ කරුණු හඳුනාගෙන දැනට ක්‍රියාත්මකවන ඉදිකිරීම් ව්‍යාපෘති කාර්යක්ෂම හා ඵලදායී ලෙස අධීක්ෂණය කිරීමට සමාගම ක්‍රියාමාර්ග ගෙන නොතිබීම සමාගමේ අඛණ්ඩ පැවැත්මට ද බලපාන බව විගණනයේ දී නිරීක්ෂණය විය.	ව්‍යාපෘති අවසන් කිරීමට ඇස්තමේන්තු කළ කාලයට වඩා වැඩි කාලයක් ගත වීමෙන් ද්‍රව්‍යමය පිරිවැය ඇස්තමේන්තුගත පිරිවැයට වඩා වැඩි වීම, අධික පොදුකාර්ය පිරිවැය, කාලය දීර්ඝ කිරීමේ අනුමැතීන් ලබා ගැනීමට ප්‍රමාද වීම, වසංගත තත්ත්වය, ගෙවීම් ප්‍රමාදයන් යනාදිය හේතු වී ඇත.	කාලය නිසිලෙස කළමනාකරණය කර ගැනීම තුළින් කොන්ත්‍රාත් පිරිවැය ඉහළ යාම් වලක්වා ඉදිකිරීම් ව්‍යාපෘතිවලින් ප්‍රමාණවත් ලාභයක් උපයා ගැනීමට කළමනාකරණය විසින් ඵලදායී පියවර ගත යුතුය.

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මනා වැඩ බෙදීමක් (Segregation of Duty) නොමැති වීම, ERP මුරපද රහස්‍ය නොවීම හා දකුණු පළාත් මූලික කාර්යාලයේ ගිණුම් අංශයේ පැවති අභ්‍යන්තර පාලනයේ දුර්වලතා	2024 නොවැම්බර් 01 දිනැතිව මේ සම්බන්ධව සමාගම විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද පැමිණිල්ලට අදාළව පළමු සිහි කැඳවීම 2025	පරීක්ෂණ කඩිනම් කර වගකිව යුතු පාර්ශවයන් ගෙන් අලාභ අයකර ගැනීමට විධිමත් හා විනයානුකූල

හේතුවෙන් එහි ගබඩා සහකාරවරයෙකු ලෙස කටයුතු කළ නිළධාරියෙක් විසින් 2021 ජනවාරි 01 දින සිට 2024 ජූනි 13 දින දක්වා කාල පරාසය තුළ සමාගමට අයත් බැංකු ජංගම ගිණුම් හතරකින් එකතුව රු. මිලියන 50.06ක මුදලක් වංචා කර ලබාගෙන තිබුණු බව සමාගමේ ප්‍රධාන විධායක නිළධාරිවරයා විසින් පත් කරන ලද මූලික විමර්ශන කමිටුවක් මඟින් අනාවරණය කරගෙන තිබුණි. අවස්ථා තුනක දී ඉන් රු.මිලියන 0.44ක් පියවා තිබුණු අතර තවදුරටත් එකතුව රු. මිලියන 49.62ක මුදලක් සමාගම වෙත අයවිය යුතුව පැවතුණ ද මෙම මුදල අයකර ගැනීමට හා වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග සහ විනය ක්‍රියාමාර්ග ගැනීමට සමාගම විසින් කඩිනමින් කටයුතු කර නොතිබුණි.

ජනවාරි 28 වන දින යොමු කරන ලදී. ඉන් අනතුරුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ආයතනය වෙත කැඳවීමට දිනයක් ලබා දෙන ලදී. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය විසින් නොපමාව පියවර ගත යුතුය.